# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය**

සංවර්ධනය සඳහා සන්නිවේදනය **MACO – 28224**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. සංවර්ධනය යනු කුමක්දැයි හඳුන්වා සංවර්ධනය මැන බැලීම සඳහා භාවිත කරනු ලබන විවිධ නිර්ණායක සහ ඒවායේ පවත්නා ගැටලු සාකච්ඡා කරන්න.

2. "ජාතික සංවර්ධනයේදී ජනමාධ්‍ය භාවිතය පිළිබඳ මහාචාර්ය විල්බර් ශ්‍රාම් ඉදිරිපත් කළ මතවාදය අභියෝගයට ලක්වී තිබේ". මේ ප්‍රකාශය පිළිබඳ නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

3. "සංවර්ධනයේදී සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යයන්හි ප්‍රජා සහභාගීත්ව ඵලදායිතාව ඉහළ මට්ටමක පවතී". නිදසුන් මගින් පෙන්වා දෙන්න.

4. ශ්‍රී ලංකාව මුහුණ දුන් අභියෝගාත්මක අවස්ථා ජයගැනීම උදෙසා ජාත්‍යන්තර සංවිධාන ලබා දුන් සහයෝගය පිළිබඳව උදාහරණ සහිතව විමර්ශනය කරන්න.

5. "රටක සංවර්ධන ක්‍රියාවලියට විද්‍යාත්මක පර්යේෂණයන්හි දායකත්වය වැදගත් වේ". සාකච්ඡා කරන්න.

6. සංවර්ධනය සඳහා සන්නිවේදනයේදී ප්‍රජා මාධ්‍යයන්හි දායකත්වය පිළිබඳ සාකච්ඡා කරන්න

7. "ශ්‍රී ලංකාව තුළ ණය ආධාර යටතේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වෙත සැලකිය යුතු දායකත්වයක් ලබා දී නොමැත" මෙම ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න.

   (i) තිරසර සංවර්ධන ඉලක්ක (SDG)
   (ii) තොරතුරු දැනගැනීමේ පනත (RTI Act) හා සංවර්ධනය
   (iii) ප්‍රජා ගුවන් විදුලි සේවා හා සංවර්ධනය
   (iv) සංවර්ධන සන්නිවේදනය සහ සමාජ මාධ්‍ය

************************